" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

සාමාන්‍ය දුරකථන / பொது தொலைபேசி / General Telephone } 011 - 2093000

ISO 9001 | SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இல / My No. } CSWP/ADM/30-38/FI/01(2025) | ඔබේ අංකය / உமது இல / Your No. } | දිනය / திகதி / Date } 2025.05.20

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)

ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)

පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)

ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.)

අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-2025 හා 2025.05.19 දිනැති ලිපි මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | විස්තරය |
|---|---|---|
| 01. | ස්වදේශ කටයුතු චක්‍රලේඛ 04/2025 හා 2025.04.29 | රාජ්‍ය වෙසක් මහෝත්සවය සැමරීම - ශ්‍රී බුද්ධ වර්ෂ 2569 |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2025 හා 2025.05.09 | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය - ආපදා ණය |

02. මෙම චක්‍රලේඛ පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන ලෙස කාර්යාලයේ ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.ඩී.ඒ. ලක්මාල් රූපසිංහ,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092606
ෆැක්ස් අංකය : 011-2092605
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2025

මගේ අංකය : EST-6/04/LON/1030
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2025.05.09

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය - ආපදා ණය**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2008.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2008 සහ 2025.03.22 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2025 හි 04.4 උපවගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. 2025 අයවැය යෝජනා මඟින් රාජ්‍ය සේවකයන්ගේ අවම මූලික වැටුප වැඩිකිරීම සැලකිල්ලට ගෙන රාජ්‍ය සේවකයන් සඳහා ආපදා ණය ලබාදීමේ උපරිම සීමාව දැනට පවතින රු. 250,000/- සිට රු. 400,000/- දක්වා ඉහළ නැංවීමට රජය තීරණය කර ඇත.

03. ඉහත විධිවිධාන අනුව, නිලධරයාට හිමිවන ණය මුදල තීරණය කිරීමේ දී නිලධරයාගේ වැටුප ලෙස 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන IIහි මූලික වැටුප අදාළ කරගනිමින් නිලධරයා ලබන මාස දහයක වැටුප හෝ රු. 400,000/- ක් හෝ යන දෙකෙන් අඩු මුදල ගෙවිය යුතු ය.

04. ඒ අනුව, නිලධරයෙකු ණය/ අත්තිකාරම් ලබාගැනීමේ දී සලකා බලනු ලබන වැටුපෙන් 40% සීමාව ගණනය කිරීමේ දී නිලධරයාගේ වැටුප ලෙස 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන IIහි මූලික වැටුප අදාළ කර ගත යුතු ය.

05. තවද, ආපදා ණය මුදල ආපසු අයකිරීමේ දී පාදක කර ගත යුතු වැටුප ලෙස 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන IIහි මූලික වැටුප අදාළ කර ගත යුතු ය.

06. එහිදී, පවත්නා උපරිම සීමාවන් ඉක්මවා නොයන පරිදි සහ වර්ෂය තුළ ණය ලබාදීම් සිදු කිරීමට හැකි වන පරිදි, සුදුසු ප්‍රමුඛතා අනුපිළිවෙළ ඒ ඒ ආයතනය විසින් සකස් කරගත යුතු ය.

07. මෙම විධිවිධාන 2025.05.01 දින සිට ක්‍රියාත්මක වේ.

08. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.


එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2699399
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk